# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1780/32 - 2012 ඔක්තෝබර් මස 19 වැනි සිකුරාදා - 2012.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී. බී 104/44.

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත**

114 වැනි වගන්තිය යටතේ වූ නියමය

"ශ්‍රී ලංකා දයාල්භාග් රදාසෝමි සැට්සැන්ග් සංගමයේ " භාරකරුවන් වන -

1. වේලායුදන් තේවසේනාතිපති
2. වේලායුදන් සිවඥාණසෝති
3. වේලායුදන් සුන්දරේස්වරන්
4. කාලීදාසන් විෂ්ණුදාසන්
5. සභාපතිපිල්ලෙ සිවනාදන්
6. වේලුපිල්ලෙ තිරුනීලකාන්දන් ; සහ
7. වල්ලිපුරම් කාලිදාසන්

යන අය එකී භාරයේ භාරකරුවන් වන හෙයින්, ඔවුන් විසින් භාර ආඥාපනතේ (87 වැනි අධිකාරය වූ) 114 වගන්තිය යටතේ එකී භාරය සංස්ථාගත කිරීම සඳහා අධිකරණ අමාත්‍යවරයා වෙත ඉල්ලුම්කර ඇති හෙයින් ද,

එකී භාර ආඥාපනත ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අධිකරණ අමාත්‍ය රාවුෆ් හකීම් වන මා විසින් මෙම නියමය මගින් එකී භාරය සංස්ථාගත කරන ලෙස මෙයින් විධාන කරනු ලබන අතර -

(අ) කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කනපතිපිල්ලේ ඥාණසේකරම් විසින් සහතික කරන ලද 2011 සැප්තැම්බර් මස 18 දින අංක 836 දරන භාර ප්‍රකාශය සහ ඉහත කී භාරයේ රීති යටතේ යථා පරිදි පත් කරන ලද ඉහත නම් සඳහන් භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත "ශ්‍රී ලංකා දයාල්භාග් රදාසෝමි සැට්සැන්ග් සංගමය" යන නාමය සහ අභිධානය යටතේ සංස්ථාවක් විය යුතු බවටත් ;

1A - PG 0 01414 — 385 (2012/10)

(ආ) ඉහත කී භාරකරුවන් විසින් ඉහත කී භාරය වෙනුවෙන් එකී නාමය සහ විලාශය යටතේ යම් නිශ්චල හෝ චංචල දේපළක් මිලදී ගැනීම, ලබා ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කරනු ලැබිය හැකි බවටත් ; සහ

(ඇ) ඉහත කී භාරකරුවන් විසින් එකී නාමය සහ විලාශය යටතේ ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත ඉහත කී භාරයට අදාළව පැන නගින නඩු නිමිති සහ නඩුවලදී යම් අධිකරණයක් ඉදිරිපිට නඩු පැවරීම සහ නඩු පවරනු ලැබීමටත්, පිළිතුරු දීමට සහ පිළිතුරු ලබා ගැනීමටත්, විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ විත්තිවාචක ලබා ගැනීමටත් එකී භාරකරුවන්ට හැකි බවටත්,

මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මෙම නියමය අවශ්‍ය යයි මට පෙනී යන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම හෝ කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකිය.

රාවුෆ් හකීම්,
අධිකරණ අමාත්‍ය.

2012 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

11-234

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.